91)

# අපචාරී ළමුන් සඳහා ආයතනිකව පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික හා සමාජානුයෝගී වැඩ සටහන් පිළිබඳව කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්.

අධ්‍යාපන දර්ශනපති උපාධිය


කේ. පී. කේ. ආර්. සෝමලතා මැණිකේ

බී. ඒ. ගෞරව 11 පෙළ (ලංකා)

අධ්‍යාපන ඩිප්ලෝමා සම්මාන (ලංකා)

අධ්‍යාපන පීඨය,

කොළඹ විශ්වවිද්‍යාලය,

කොළඹ 03.


1984. 12. 10


UCLIB

398909

398909

## <u>සංක්ෂිප්තය.</u>

අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී **මෙන්ම, සමාජ ක්ෂේත්‍රයේදීත්** කාලීනව වැදගත්කමක් උසුලන, බාලාපචාරීන් සම්බන්ධ ගැටළුව ඇසුරු කර ගනිමින්, "අපචාරී ළමුන් සඳහා ආයතනිකව පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික හා සමාජානුයෝගී වැඩ සටහන්" පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙහිදී සිදු කරන ලදී. අපචාරී ළමුන් සුමගට යොමු කරලීම සඳහා දැනට පවත්නා වැඩ පිළිවෙල ප්‍රමාණවත් වේද? යන ගැටළුව මෙහිදී විමර්ශනයට භාජනය විය.

පර්යේෂණය මෙහෙයවීමේදී, ලංකාවේ සමාජ සේවා අමාත්‍යාංශයට, අයත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන බාලාපචාරී පුනරුත්ථාපන ආයතන කිහිපය අතුරින්, මග්ගොන අනුමත පාසැල හා මාකොළ සහ රම්මුතුගල සහතික පාසැල යන ආයතන තුන නියැදිය වශයෙන් තෝරාගන්නා ලදී. එම ආයතන වල දැනට නේවාසිකව සිටින ළමුන්ගෙන 150 ක නියැදියක් සහ එම ආයතන වලින් වර්ෂ 5 ක් ඇතුළත පිටවූ ළමුන්ගෙන් 60 ක නියැදියක් ද ඒ සඳහා යොදා ගන්නා ලදී. එම ළමුන් සහ එම ආයතන වල පාලක නිලධාරීන් සමග ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා භාවිතයෙන් පර්යේෂණ දත්ත රැස්කර ගන්නා ලදී.

මෙහි අධ්‍යයනයේදී පළමුවන පරිච්ඡේදයෙන් බාලාපචාරය පිළිබඳව හැඳින්වීමක් සහ ඒ පිළිබඳව දැනට පවතින නිර්වචනයන් ද ඉදිරිපත් කරන ලදී. බාලාපචාරීන් වශයෙන් සලකනු ලබන වයස් සීමාව, බාලාපචාරය ඇතිවීමට තුඩුදෙතැයි සැලකෙන හේතු, අපචාරී ක්‍රියා ලෙස එක් එක් රටවල සලකනු ලබන දෑ, අපචාරය සම්බන්ධයෙන් පනවා ඇති නීති රීති, පනත් සහ එම ගැටළුවේ කාලීන වැදගත්කම පිළිබඳවත් මෙහිදී සාකච්ඡා කරන ලදී. දෙවැනි පරිච්ඡේදයෙන් බාලාපචාරය ඇතිවීමට තුඩු දෙන හේතු හා බාලාපචාරය වැළැක්වීමට කළ යුතු පිළියම් ද, බාලාපචාරී පුනරුත්ථාපන ආයතනවල ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන් පිළිබඳව සඳහන් වන පර්යේෂණ සාහිත්‍යයද ඉදිරිපත් කරන ලදී. තුන්වන පරිච්ඡේදයෙන් පර්යේෂණ අරමුණු සහ පර්යේෂණ සැලැස්ම පිළිබඳව සඳහන් කරන ලදී. එම අරමුණු මත දියත් කරන ලද පර්යේෂණයේදී, බාලාපචාරී පුනරුත්ථාපන ආයතන වල ළමුන්ගෙන්, එම ආයතන වලින් පිටවූ ළමුන්ගෙන හා ඒවායේ පාලක නිලධාරීන්ගෙන් ලබාගත් දත්ත ඉදිරිපත් කිරීම හතරවන පරිච්ඡේදයෙන් සිදුකරන ලදී. එක් දත්තයන් විශ්ලේෂණය කර අර්ථකථනය කිරී පස්වන පරිච්ඡේදයෙන් සිදුකරන ලදී. එම දත්ත විශ්ලේෂණය තුළින් බැසගත හැකි නිගමන සහ බාලාපචාරී පුනරුත්ථාපන ආයතනයන් සඳහා උචිත වැඩසටහන් පිළිබඳව නව යෝජනා 6 වැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත.

-------